# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,125 - 2019 මැයි මස 24 වැනි සිකුරාදා - 2019.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1046 | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1052 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - පළාත් සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2019 මැයි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජුනි මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## තනතුරු - ඇබෑර්තු

### තවලම ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

තවලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචි පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### උපලේඛනය

(1) පුස්තකාල සහායක III ශ්‍රේණිය - පුරප්පාඩු ගණන 01

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/1/1 හා 2019.03.26 දිනැති ලිපිය අනුව,

*වැටුප් පරිමාණය* .- PL- 1-2016 A - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/-

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව 2019.01.01 වැනි දිනට ආරම්භ වැටුප රු. 21,746/-) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

*සීමිත බඳවා ගැනීම :*

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම (මින් විෂයයන් පහක් එකවර සමත්ව තිබිය යුතුය.)

*හා*

ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති හා ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*වෘත්තීය සුදුසුකම් :*

අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)

*බඳවා ගැනීමේ ක්‍රමය* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

*විවෘත බඳවා ගැනීම* : (සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්රුවන් ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.)

*අධ්‍යාපන සුදුසුකම්* .- සීමිත බඳවා ගැනීමේ අයදුම්කරුවන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් විවෘත බඳවා ගැනීම සඳහා ද අදාළ වේ.

*බඳවා ගැනීමේ ක්‍රමය* .- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| *ලකුණු ලබාදෙන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02. | වෘත්තීය සුදුසුකම් | 10 | |
| 03. | පළපුරුද්ද | 10 | |
| 04. | සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය | 45 | |
| 05. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | | 100 | |

(2) ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය - පුරප්පාඩු ගණන 01

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/12/08 හා 2014.09.29 දිනැති ලිපිය අනුව

*වැටුප් පරිමාණය* .- PL - 2-2016 A - රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක II අනුව 2019.01.01 දිනට ආරම්භක වැටුප රු. 22,642) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

*සීමිත බඳවා ගැනීම* :

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහක් එකවර සමත්ව තිබිය යුතුය.)

*හා*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන්සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිම.

*හෝ*

අ.පො.ස. (සා/පෙළ) නොමැති නම් තාතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශතේ තුන්වන මට්ටමේ නිපුණතාවක් ලබා තිබිම.

*වෘත්තීය සුදුසුකම්* :

අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් තිබීම (සහතික මගින් සනාථ කළ යුතුය.)

*බඳවා ගැනීමේ ක්‍රමය* - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

විවෘත බඳවා ගැනීම (සිමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන්නේ පුරප්පාඩු පුරවනු ලැබේ.)

*අධ්‍යාපන සුදුසුකම්* :-

සීමිත බඳවා ගැනීමේ අයදුම්කරුවන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් විවෘත බඳවා ගැනීම් සඳහාද අදාළ වේ.

බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| *ලකුණු ලබාදෙන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02. | වෘත්තීය සුදුසුකම් | 10 | |
| 03. | පළපුරුද්ද | 10 | |
| 04. | සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය | 45 | |
| 05. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | | 100 | |

(3) විදුලි කාර්මික III ශ්‍රේණිය - පුරප්පාඩු ගණන 01

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහාවන බඳවා ගැනීමේ පටිපාටිය හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/12/08 හා 2013.12.23 දිනැති ලිපිය අනුව

*වැටුප් පරිමාණය* : PL- 2-2016A - රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450/-

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක II අනුව 2019.01.01 වැනි දිනට ආරම්භක වැටුප 22,642) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*සීමිත බඳවා ගැනීම* :

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහක් එකවර සමත්ව තිබිය යුතුය.)

*හා*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.

*හෝ*

අ.පො.ස. (සා/පෙළ) නොමැති නම් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ) අවම වශයෙන් තුන්වන මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.

*වෘත්තීය සුදුසුකම්* :

අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් තිබීම (සහතික මගින් සනාථ කළ යුතුය.)

*බඳවා ගැනීමේ ක්‍රමය*.- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

විවෘත බඳවා ගැනීම : (සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.)

*අධ්‍යාපන සුදුසුකම්* :

සීමිත බඳවා ගැනීමේ අයදුම්කරුවන්ට අදාළ අධ්‍යාපන සුදුසුකම් විවෘත බඳවා ගැනීම් සඳහාද අදාළ වේ.

බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| *ලකුණු ලබාදෙන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02. | වෘත්තීය සුදුසුකම් | 10 | |
| 03. | පළපුරුද්ද | 10 | |
| 04. | සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය | 45 | |
| 05. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| එකතුව | | 100 | |

(4) වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය : පුරප්පාඩු ගණන 04

(වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරට ආදාහනාගාර කම්කරු, ආයුර්වේද කම්කරු, ගබඩා කම්කරු, ජලපොම්ප කම්කරු, මාර්ග කම්කරු, විදුලි කම්කරු, සුසානභූමි කම්කරු තනතුරු අයත් වේ.)

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/1/1 හා 2019.03.26 දිනැති ලිපිය අනුව වැටුප් පරිමාණය - PL - 1-2016A - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව 2019.01.01 දිනට ආරම්භක වැටුප 21,746) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

*අධ්‍යාපන සුදුසුකම්* : 8 වන ශ්‍රේණිය (9 වන වසර) සමත් විය යුතුය.

*වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද* : අදාළ නැත

*බඳවා ගනු ලබන ක්‍රමය* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| *ලකුණු ලබාදෙන ශීර්ෂ* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය | 30 | 50% |
| 02. | අධ්‍යාපන සුදුසුකම් හා තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 15 | |
| 03. | සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය | 45 | |
| 04. | පෞරුෂත්වය | 05 | |
| 05. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

(5) සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය - පුරප්පාඩු ගණන 01

දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුව හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/12/08 හා 2014.01.03 දිනැති ලිපිය අනුව

*වැටුප් පරිමාණය* : PL- 1-2016A - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - රු. 36,410

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක II අනුව 2019.01.01 දිනට ආරම්භක වැටුප 21,746) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*අධ්‍යාපන සුදුසුකම්* : 8 වන ශ්‍රේණිය (9 වන වසර) සමත් විය යුතුය.

*වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද* : අදාළ නැත

*බඳවා ගැනීමේ ක්‍රමය* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| ලකුණු ලබාදෙන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය | 30 | 50% |
| 02. | අධ්‍යාපන සුදුසුකම් හා තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 15 | |
| 03. | සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය | 45 | |
| 04. | පෞරුෂත්වය | 05 | |
| 05. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

ii. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ කාලයක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතුය.

iii. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-45 අතර විය යුතුය. (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

iv. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත අයෙකු විය යුතුය.

v. අදාළ තනතුරට අදාළ අවම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට ප්‍රථම සම්පූර්ණ කර තිබිය යුතුය.

vi. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කල පමණින් එම අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුසුකමක් ලෙස නොසැලකිය යුතුය.

සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

ii. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය

iii. බඳවා ගනු ලබන තනතුරෙහි වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

iv. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු පත්වීම ස්ථිර කළ සේවකයින් වසර (01) වැඩබැලීමේ කාලයකට යටත් කරනු ලැබේ. (සීමිත බඳවා ගැනීම් වලදී)

v. මෙයට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, දකුණු පළාත් මූල්‍ය රීති, දකුණු පළාත් පළාත් සභා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ තවලම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

*අයදුම්පත ඉදිරිපත් කල යුතු ආකාරය :*

i. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක තනි පැත්තේ අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කල යුතුය.

ii. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම්කරනු ලබන තනතුර සඳහන් කර 2019.06.14 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, සභාපති, තවලම ප්‍රාදේශීය සභාව, බටහේන, තවලම, යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලැබෙන සේ එවිය යුතුය.

iii. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

iv. තැපෑලෙන් ලැබෙන ලිපි හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යවනු ලබන අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට සුදුසුකම් සපුරා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

v. යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් පිළියෙල කර වෙන වෙනම කවර වල බහා ඉදිරිපත් කල යුතුය.

vi. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියවිලිවල ඡායා පිටපතක් අමුණා එවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට එම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව තිබිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සහතික

(ඇ) වෘත්තීය සුදුසුකම් සහතික කිරිමේ සහතික

(ඈ) පළපුරුද්ද පිළිබඳ සහතික

(ඉ) ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත (දෙපසම)

(ඊ) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳව සහතිකය (එම සහතිකය අයදුම්පත් භාරගන්නා අවසන් දිනට මාස හයකට නොවැඩි කාලයක් තුල ලබා ගත්තක් විය යුතුය)

අයදුම්පත් කැඳවන අවසාන දිනට ඉල්ලුම් කරනු ලබන සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කරුණු පිළිබඳ අවසාන තීරණය තවලම ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 07 වන දින,
තවලම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදීය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***තවලම ප්‍රාදේශීය සභාව***

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ................................... තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමඟ නම :——————————————

   (i) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————————

2. ස්ථිර පදිංචිය :——————————————

3. (i) උපන් දිනය : අවුරුද්ද:—————— මාසය:—————— දිනය:——————

   (ii) අයදුම්පත භාර ගන්නා 2019.06.14 දිනට වයස අවුරුදු:—————— මාස:—————— දින:——————

4. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————

5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————

6. විවාහක/අවිවාහක බව:——————————————

7. ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද?:——————————————

8. ජාතිය :——————————————

9. අධ්‍යාපන සුදුසුකම්:——————————————

10. වෘත්තීය සුදුසුකම්/සේවා පළපුරුද්ද:——————————————

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?:——————————————

12. ඔබ දැනටමත් තවලම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්:——————————

i. දැනට දරන තනතුර :——————————

ii. එම තනතුරට පත් වූ දිනය:——————————

iii. එම පත්වීමේ ස්වභාවය (අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත) :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසුව සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බවද මා දනිමි.

——————————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

05-691

---

# පළාත් පාලන නිවේදන

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (i) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (i) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 දින අංක 11811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්ද වූ ද දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1,878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද සම්මත අතුරු ව්‍යවස්ථාවල

| අතුරු ව්‍යවස්ථා අංකය | අතුරු ව්‍යවස්ථාවේ නම |
|---|---|
| XXI | වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව |

පිළිබඳ යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ *ගැසට් පත්‍රයේ* පළවන දින සිට පනවා ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් 2018.11.13 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 5:2 යටතේ ඉහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෝමසිරි වීරමන්,
සභාපති,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් 25 වැනි දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

05-464

## වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව විසින් 2019.01.04 වන දින අංක ෂා.කු/2019.01.04/10/109 දරන වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇන්තෝනිපිල්ලෙයි ජෙබනේසන්,
සභාපති,
වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව.

වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව,
මානිප්පායි.
2019 ජනවාරි 04 වැනි දින.

**2019.01.04 වැනි දින අංක ෂා. කු/2019.01.04/10/109 දරන තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 2018.05.09 වන දින අංක 2070/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ උතුරු පළාතේ පළාත් සභාව විසින් 2018.09.11 වන දින ස්ථිර කරන ලද 2018.10.08 වන දින අංක 2092/06 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව සම්මත අතුරු ව්‍යවස්ථා අංක 07 සිට අංක 09 දක්වා වූ කොටස් වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථාවේ තීරණය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාවේ තීරණය කරන ලදී.

05-662

---

## මහරගම නගර සභාව

නගර සභා ආඥාපනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටිරාජ් ලක්රුවන් පියරත්න,
සභාපති,
මහරගම නගර සභාව.

| අනු. අංකය | සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 01 | සැ. අ. 179, ඩබ්. පී. ද සිල්වා මිනින්දෝරු මහතා විසින් අඳින ලදී. | තලවතුගොඩ ධර්මලපාල මාවත අතුරු මාර්ගය (ව. අ. 32/1 සිට 40/5) | තලවතුගොඩ නැගෙන හිර | අඩි 281 | අඩි 15 අඩි 12 | ව. අ. 32/1 නිවස | ව. අ. 40/5 නිවස |

| අනු. අංකය | සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 02 | සැ. අ. 2934 දිනය : 2015.08.11 එම්. එම්. එස්. ප්‍රනාන්දු මහතා | මහරගම නාවින්න සුචරිත මාවත අතුරු මාර්ගය | නාවින්න | මී. 32 | මී. 3 | ව. අ. 80 | ව. අ. 80/3 |

| අනු. අංකය | සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 03 | මිනින්දෝරු එම්. ජේ. සේතුංග මහතා සැ. අ. 985 දිනය : 1972.01.20 | හේනේගෙදර පාර ව. අ. 60න් ආරම්භ වන අතුරු මාර්ගය | 532 බී ගොඩිග මුව | මී. 52 | මී. 4.5 | ව. අ. 60 | ව. අ. 60 D |

| අනු. අංකය | සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 04 | මිනින්දෝරු එම්. ජේ. සේතුංග මහතා සැ. අ. 985 දිනය : 1972.01.20 | හේනේගෙදර පාර ව. අ. 66න් ආරම්භ වන අතුරු මාර්ගය | 532 බී ගොඩිග මුව | මී. 80 | මී. 6.10 | ව. අ. 66 | ව. අ. 68/5 |

| අනු. අංකය | සැලසුම් අංකය, දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ගයේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 05 | මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන මහතා සැ. අ. 1337 දිනය : 2005.06.16 | ලියනගොඩ එකමුතු මාවත අවසන් කොටස | කොට්ටාව නැගෙනහිර | මී. 190<br>මී. 90 | මී. 6.0<br>මී. 4.5 | එකමුතු මාවත ආරම්භක | ව. අ. 178/80 B |

| අනු. අංකය | සැලසුම් අංකය, දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ග යේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 06 | සැ. අ. 745 මිනින්දෝරු එස්. ඒ. විජේසිංහ මහතා දිනය : 1992.09.16 | මාලපල්ල ගලවිල පාරෙන් ආරම්භ වන ව.අ. 502/17 න් අවසන් වන අතුරු මාර්ගය | මාලපල්ල නැගෙනහිර | මී. 114<br>මී. 35<br>මී. 23 | මී. 4.5<br>මී. 3.65<br>මී. 3.0 | ගලවිල පාර | ව. අ. 502/17 |

| අනු. අංකය | සැලසුම් අංකය, දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ග යේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 07 | එන්. අබේසිරි මිනින්දෝරු මහතා සැ. අ. 9516 දිනය : 1995.04.09 | විජේසේකර මාවත 1 වන අතුරු මාර්ගය | මිරිහාන දකුණ | මී. 32<br>මී. 27.7<br>මී. 3.0 | මී. 4.0<br>මී. 3.0<br>මී. 3.0 | විජේසේකර මාවත | ව.අ. 33/3 |

| අනු. අංකය | සැලසුම් අංකය, දිනය හා මිනින්දෝරු මහතාගේ නම | මාර්ගයේ නම | ග්‍රාමසේවා වසම | මාර්ග යේ දිග | මාර්ගයේ පළල | මාර්ගයේ ආරම්භය | මාර්ගයේ අවසානය |
|---|---|---|---|---|---|---|---|
| 08 | සැ. අ. 548 මිනින්දෝරු ඒ. ආර්. සිල්වා මහතා | පන්නිපිටිය, හෝකන්දර පාරේ, වරිපනම් අංක 156 සිට 148/5 නිවස දක්වා අතුරු මාර්ගය | කොට්ටාව බටහිර | අඩි 150 | අඩි 15 | ව. අ. 156 | ව. අ. 148/5 |

05-594

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

### මාතලේ මහා නගර සභාව

2018.11.16 දින පළවූ අංක 2098 *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 11-603/11 හි 2019 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම යටතේ සඳහන් වූ පහත ගාස්තු 2019 වර්ෂයේ අප්‍රේල් මස 05 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 06 ː 1 ː 01 ː 10 යටතේ සංශෝධනය කරන ලදී.

**01. පිටු අංක 2203 හා 2204 - හොකී ක්‍රීඩා පිටිය කුළියට දීම - පැවති ගාස්තුව**

| | රු. ශ. |
|---|---|
| • ක්‍රීඩා සමාජ සඳහා දිනකට | 3,000 0 |
| • ක්‍රීඩා සමාජ සඳහා වරුවකට | 1,000 0 |
| • පාසල් සඳහා දිනකට | 1,000 0 |
| • පාසල් සඳහා වරුවකට | 500 0 |
| • එක් තරගයක් සඳහා | 500 0 |
| • දිනකට හෝ වරුවකට නොගැනෙන තරගයක් සඳහා | 500 0 |
| • ආදායම් ලබන තරගයක් සඳහා | 6,000 0 |
| • අලෙවි ප්‍රවර්ධන හා ප්‍රචාරණ වැඩසටහනක් සඳහා දිනකට | 5,000 0 |

**හොකී ක්‍රීඩාපිටිය කුළියට දීම - සංශෝධන ගාස්තුව**

| | |
|---|---|
| • ක්‍රීඩා සමාජ සඳහා දිනකට (සංශෝධනය නොවේ) | 3,000 0 |
| • ක්‍රීඩා පුහුණු ආයතන (ඇකඩමි) සඳහා දිනකට | 10,000 0 |
| (ගරු නගරාධිපතිතුමාගේ හා නාගරික කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතුය) | |
| • පාසල් සඳහා දිනකට | 3,000 0 |
| • පාසල් සඳහා වරුවකට | 2,000 0 |
| • එක් තරගයක් සඳහා | 1,500 0 |
| • දිනකට හෝ වරුවකට නොගැනෙන තරගයක් සඳහා | 2,000 0 |
| • ආදායම් ලබන තරගයක් සඳහා | 10,000 0 |
| • අලෙවි ප්‍රවර්ධන හා ප්‍රචාරණ වැඩසටහනක් සඳහා දිනකට | 10,000 0 |
| මීට අමතරව ජලය, විදුලිය, කසළ බැහැර කිරීම සඳහා | 5,000 0 |

ඒ. ඩී. තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මාතලේ.

05-593

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.